**සීමාසහිත ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම - 2015**

---

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ පාඩු ප්‍රකාශනය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1999 වර්ෂයේ සිට කිසිදු වෙනස්වීමකින් තොරව රු.2,374,432 ක මුදලක් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ වල ඇතුළත්ව තිබුණි. සමාගමේ වාර්තා අනුව, මෙය "packed product" ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, එම වත්කමේ පැවැත්ම තීරණය කිරීම සඳහා කිසිදු සාක්ෂියක් නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ වත්කම් සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2014 වර්ෂය තුළදී නිම කරන ලද ගබඩා ටැංකි සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා රු.මිලියන 17 ක වියදමක් දරා තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන දේපල, පිරියත හා උපකරණ තුළ මෙම මුදල ඇතුළත් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 1,282.14 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. මිලියන 864.77 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු. මිලියන 417.37 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 408.68 කින් ආදායම වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**3.2.1 ලාභදායීත්වය**

සමාගමේ ප්‍රධාන ආදායම් ප්‍රභවය "පර්යන්ත ගාස්තු" (through put) වන අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 41 කින් වැඩි වී තිබුණි. සමාගමේ පර්යන්තය මගින් ආනයනය කරන සෑම මෙට්රික් ටොන් එකකටම එජඩො 51 ක් පර්යන්ත ගාස්තු ලෙස සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් මෙම සමාගම වෙත ගෙවනු ලැබේ. එබැවින් සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ විකුණුම් පරිමාව පර්යන්ත ගාස්තු සඳහා සෘජුවම බලපායි. එජඩො වටිනාකමට පර්යන්ත ගාස්තු ඉන්වොයිස් කිරීමට අමතරව කාල පරිච්ඡේදය තුළ රුපියලේ අගය අඩුවීමද ආදායම කෙරෙහි දායක වී තිබුණි. සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 4 සඳහා පර්යන්ත ගාස්තු පහත පරිදි වේ.

| වර්ෂය | පර්යන්ත ගාස්තු |
| --- | --- |
| | රු.මිලියන |
| 2015 | 1,407.09 |
| 2014 | 998.40 |
| 2013 | 932.61 |
| 2012 | 930.44 |
| 2011 | 763.66 |

### 3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2015 වර්ෂය හා පෙර වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2015 | 2014 |
| --- | --- | --- |
| **ලාභදායීත්ව අනුපාත (ප්‍රතිශතය)** | | |
| දළ ලාභ අනුපාතය (GP) | 81 | 74.3 |
| ශුද්ධ ලාභ අනුපාතය (NP) | 91.1 | 86.6 |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) | 13.5 | 10.13 |
| යෙද වූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ (ROCE) | 15.1 | 11.2 |
| **ද්‍රවශීලතා අනුපාත (වාර ගණන)** | | |
| ජංගම වත්කම් අනුපාතය | 15.3:1 | 37.8:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 15.3:1 | 37.8:1 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 9.02 කින් හා සියයට 5.2 කින් වර්ධනය වී තිබුණි. මේ අතර වත්කම් මත ප්‍රතිලාභ හා යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 33.3 කින් හා සියයට 34.8 කින් වැඩි වී තිබුණි.

(ආ) ස්ථාවර වත්කම්වල, ප්‍රතිමිලදී ගැනුම්වල හා ඉතිරි කිරීම් ගිණුම්වල කරන ලද රු.මිලියන 4311.82 ක (2014 වර්ෂයේ රු.මිලියන 3214.46) ආයෝජනය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ කාරක ප්‍රාග්ධනය ශක්තිමත් තත්ත්වයක පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී සමාගම විසින් කල්බදු පදනම මත ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ මණ්ඩලයෙන් ලබා ගන්නා ලද කෙරවළපිටිය ඉඩමක සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ නැවත පිරවීම් නිෂ්පාදන පිරියතක් ඉදිකර තිබුණි. කෙසේවුවද සමාගම හා සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම අතර උපබදු ගිවිසුමක් නොතිබුණි. තවද, සමාගම වෙත සීමා සහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් උප බදු කුලී ගෙවීමක් මේ දක්වා සිදු කර නොතිබුණි.

(ආ) 2000 මාර්තු 29 දින සමාගම විසින් ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේවුවද සමාගමේ කළමනාකරණය විසින් ආයෝජන මණ්ඩලයේ සහතිකය ලබා ගෙන නොතිබුණි. එදින සිට බදු විරාමයක් ලබා ගැනීම සඳහා මෙම සහතිකය වැදගත් වේ. සහතිකයක් ලබා ගෙන නොතිබූ බැවින්, බදු විරාමය ආරම්භ වන දිනය අවිනිශ්චිත වන අතර "ව්‍යාපාරය ආරම්භ කිරීම" යන අර්ථය මත පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. කළමනාකරණ ලිපියෙන් පෙන්වා දී ඇති තොරතුරු තාක්ෂණ පද්ධතියේ දුර්වලතා සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතු වේ.